මූල්‍ය කළමනාකරණ ශාඛාව
යුද්ධ හමුදා මූලස්ථානය - උතුරු පර්ෂදය
අංක 31, නුවර පාර
දළුගම
කැළණිය

මුකශා/පා/34/2016 (65)

සියළු ස්ථාන (එක් පිටපත බැගින්) 2016 ජුනි 01

**මහජන මුදල් නොවන අරමුදල් (NON PUBLIC FUNDS) භාවිතාකර සිදුකරන ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සිදුකිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියාපිළිවෙත**

යොමුව:
අ. විජෙශා/පා/55/1 හා 2005.10.21 දිනැති විජෙශා ලිපිය.
ආ. විජෙශා/පා/1/1 (351) හා 2007.01.04 දිනැති විජෙශා ලිපිය.

1. මහජන මුදල් නොවන අරමුදල් භාවිතාකර විවිධ ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සිදුකිරීමේදී අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග පිළිබඳව උපදෙස් යොමුගත විජෙශා ලිපි මගින් රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත පමණක් නිකුත්කර ඇත. එහෙත් වර්තමානයේදී රෙජිමේන්තු මධ්‍යස්ථාන පමණක් නොව වෙනත් මූලස්ථාන/පුහුණු මධ්‍යස්ථාන සහ ආයතන වෙතින් එවැනි ඉදිකිරීම් සිදුකිරීම සඳහා යුහමු වෙතින් අනුමැතිය අපේක්ෂාකරන බව නිරීක්ෂණයවේ.

2. හමුදා චර්යා නියෝග 19/2006 මගින් යුද්ධ හමුදා මූලස්ථානයේ මූල්‍ය කළමනාකරණ ශාඛාව ස්ථාපනය කිරීමෙන් අනතුරුව මහජන මුදල් (PUBLIC FUNDS) සහ මහජන මුදල් නොවන අරමුදල් සම්බන්ධයෙන් සියළුම ප්‍රතිපත්ති, උපදෙස් සහ නියෝග නිකුත් කිරීම මෙම ශාඛාවේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලැබේ. එබැවින් මූල්‍ය විෂය පථයට අයත් සියළුම ප්‍රතිපත්තිමය තීරණ හමුදා නියෝග, හමුදා චර්යා නියෝග කෙටුම්පත්/ලිපි අනුමැතිය සඳහා යුද්ධ හමුදාධිපති වෙත ඉදිරිපත් කිරීමේදී මූල්‍ය කළමනාකරණ ශාඛාවේ නිර්දේශ සහිතව ඉදිරිපත්කල යුතු අතර ඒ පිළිබඳව අදාල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට සියළුම ආයතන ප්‍රධානීන් විසින් පියවර ගතයුතුවේ.

3. මහජන මුදල් නොවන අරමුදල් යොදවා සිදුකිරීමට අපේක්ෂිත සියලුම ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සම්බන්ධයෙන් යුහමු අනුමැතිය ලබාගැනීම පිණිස පහත සඳහන් නව ක්‍රියාපිළිවෙත හඳුන්වා දෙනු ලැබේ.

අ. අළුතින් ආරම්භ කිරීමට අපේක්ෂිත නව ගොඩනැගිලි/වෙනත් ඉදිකිරීම් සඳහා මෙම ලිපියට ඇමුණුම 'අ' වශයෙන් යාකර ඇති ආකෘතියේ සඳහන් ලිපි/ලේඛණ අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීම.

ආ. ගොඩනැගිලි පුනරුත්ථාපනය (Rehabilitation of Buildings/Structures) සහ ප්‍රධාන වශයෙන් සිදුකරන අළුත්වැඩියා කටයුතු (Major Repairs) සඳහා යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත්කර ඇති මුදල් කපාහැරීමේ අනුමත සීමාවන් ඉක්මවා යන අවස්ථාවන්හිදී පමණක් මෙම ලිපියට ඇමුණුම 'ආ' වශයෙන් යාකර ඇති ආකෘතියේ සඳහන් ලිපි/ලේඛණ අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීම.

4. යොමුගත විජෙශා ලිපි මගින් මෙම විෂයය පිළිබඳව ලබාදී ඇති උපදෙස් මින් අභිබවනය වන අතර මහජන මුදල් නොවන අරමුදල් භාවිතාකර සිදුකරන සියලුම ඉදිකිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීමට අදාල මෙම උපදෙස් <u>2016.06.01 දින සිට</u> ක්‍රියාත්මකවන බව කාරුණිකව දන්වා සිටිනු ලැබේ.

ආර්ඩී උඩවත්ත පීඑස්සී එට්ඩ
මේජර් ජෙනරල්
අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කළමනාකරණ

මුකගා/පා/34/2016 (65) හා 2016.06.01 දිනැති ලිපියට
ඇමුණුම 'අ'

නව ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සිදුකිරීමේදී අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත්කල යුතු ලිපි/ලේඛණ

| අනු අංකය | ස්ථානය | ඉදිරිපත්කල යුතු ලිපි/ලේඛණ |
|---|---|---|
| 1 | අ. සියලුමරෙජිමේන්තු මධ්‍යස්ථාන<br>ආ. නිත්‍ය/ස්වේච්ඡා ඒකක<br>ඇ. රෙජිමේන්තු පුහුණු පාසැල් | (1) රෙජිමේන්තු මන්ත්‍රණ සභාවේ අනුමැතිය ඇතුලත් සාකච්ඡා සටහනේ අදාල කොටස<br>හෝ<br>රෙජිමේන්තු මන්ත්‍රණ සහා සාමාජිකයන්ගේ අත්සන් සහිත මණ්ඩල වාර්තාව<br><br>(2) නව ඉදිකිරීම සිදුකරන ස්ථානය/ඉඩම යුද්ධ හමුදාව වෙත නෛතිකව අයත් බව තහවුරු කිරීම සඳහා ආයතන ප්‍රධානිගේ සහතිකය.<br><br>(3) යුද්ධ හමුදා වැය ශීර්ෂ වෙතින් අදාල නව ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගත නොහැකි බව සනාථ කිරීම පිණිස ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් ඒ බව තහවුරු කරනලද ලිපියේ පිටපතක්.<br><br>(4) නව ඉදිකිරීම් සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් අනුමතකල ප්‍රමාණ බිල්පත් (BOQ)<br><br>(5) ඉංජිනේරු සේවා රෙජිමේන්තු නියෝජිතයෙකුගේ සහභාගිත්වය සහිතව නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත අනුගමනය කරමින් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු අනුමතකල ප්‍රමාණ බිල්පත් අනුව සකස් කරනලද ඇස්තමේන්තුව.<br><br>(6) නව ඉදිකිරීම සඳහා භාවිතාකරන අරමුදල්, රෙජිමේන්තු/ඒකක අනිවාර්ය ඉතිරිකිරීම් හෝ යහසාධක අරමුදල් තුල සාමාජික තැන්පතු මුදල් හෝ එම තැන්පතු සඳහා හිමි පොලී/ලාභ මුදල් නොවන බවට ආයතන ප්‍රධානිගේ සහතිකය. |
| 2 | අ. ආරක්ෂක සේනා මුලස්ථාන<br>ආ. සේනාංක මුලස්ථාන<br>ඇ. ඉදිරි නඩත්තු පෙදෙස්<br>ඈ. ඉහත මුලස්ථාන යටතේ පාලනයවන පුහුණු පාසැල් | (1) අදාල පාලන බලප්‍රදේශයේ ආරක්ෂක සේනා ආඥාපතිගේ ලිඛිත අනුමැතිය.<br><br>(2) නව ඉදිකිරීම සිදුකරන ස්ථානය/ඉඩම යුද්ධ හමුදාව වෙත නෛතිකව අයත් බව තහවුරු කිරීම සඳහා ආයතන ප්‍රධානිගේ සහතිකය.<br><br>(3) යුද්ධ හමුදා වැය ශීර්ෂ වෙතින් අදාල නව ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාගත නොහැකි බවට සනාථ කිරීම පිණිස ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් ඒ බව තහවුරු කරනලද ලිපියේ පිටපතක්.<br><br>(4) නව ඉදිකිරීම් සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් අනුමතකල ප්‍රමාණ බිල්පත් (BOQ)<br><br>(5) ඉංජිනේරු සේවා රෙජිමේන්තු නියෝජිතයෙකුගේ සහභාගිත්වය සහිතව නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත අනුගමනය කරමින් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු අනුමතකල ප්‍රමාණ බිල්පත් අනුව සකස් කරනලද ඇස්තමේන්තුව. |

මුකගා/පා/34/2016 (65) හා 2016.06.01 දිනැති ලිපියේ
ඇමුණුම 'ආ'

## ගොඩනැගිලි පුනරුත්ථාපනය සහ ප්‍රධාන වශයෙන් සිදුකරන අලුත්වැඩියා කටයුතු සඳහා අනුමැතිය ලබාගැනිමට ඉදිරිපත්කල යුතු ලිපි/ලේඛණ

| අනු අංකය | ස්ථානය | ඉදිරිපත්කල යුතු ලිපි/ලේඛණ |
|---|---|---|
| 1 | අ. සියලුමරෙපිමේන්තු මධ්‍යස්ථාන<br>ආ. නිත්‍ය/ස්වේච්ඡා ඒකක<br>ඇ. රෙපිමේන්තු පුහුණු පාසැල් | (1) රෙපිමේන්තු මන්ත්‍රණ සභාවේ අනුමැතිය ඇතුලත් සාකච්ඡා සටහනේ අදාල කොටස<br>හෝ<br>රෙපිමේන්තු මන්ත්‍රණ සභා සාමාජිකයන්ගේ අත්සන් සහිත මණ්ඩල වාර්තාව<br><br>(2) යුද්ධ හමුදා වැය ශීර්ෂ වෙතින් අදාල අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන ලබාගත නොහැකි බව සනාථ කිරීම පිණිස ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් ඒ බව තහවුරු කරනලද ලිපියේ පිටපතක්.<br><br>(3) අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් අනුමතකල ප්‍රමාණ බිල්පත් (BOQ)<br><br>(4) ඉංජිනේරු සේවා රෙපිමේන්තු නියෝජිතයෙකුගේ සහභාගිත්වය සහිතව නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත අනුගමනය කරමින් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු අනුමතකල ප්‍රමාණ බිල්පත් අනුව සකස් කරනලද ඇස්තමේන්තුව.<br><br>(5) අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් භාවිතාකරන අරමුදල්, රෙපිමේන්තු/ඒකක අනිවාර්ය ඉතිරිකිරීම් හෝ යහසාධක අරමුදල් තුල සාමාජික තැන්පතු මුදල් හෝ එම තැන්පතු සඳහා හිමි පොලි/ලාභ මුදල් නොවන බවට ආයතන ප්‍රධානිගේ සහතිකය. |
| 2 | අ. ආරක්ෂක සේනා මුලස්ථාන<br>ආ. සේනාංක මුලස්ථාන<br>ඇ. ඉදිරි නඩත්තු පෙදෙස්<br>ඇ. ඉහත මුලස්ථාන යටතේ පාලනයවන පුහුණු පාසැල් | (1) අදාල පාලන බලප්‍රදේශයේ ආරක්ෂක සේනා ආඥාපතිගේ ලිඛිත අනුමැතිය.<br><br>(2) යුද්ධ හමුදා වැය ශීර්ෂ වෙතින් අදාල අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ප්‍රතිපාදන ලබාගත නොහැකි බව සනාථ කිරීම පිණිස ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් ඒ බව තහවුරු කරනලද ලිපියේ පිටපතක්.<br><br>(3) අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු වෙතින් අනුමතකල ප්‍රමාණ බිල්පත් (BOQ)<br><br>(4) ඉංජිනේරු සේවා රෙපිමේන්තු නියෝජිතයෙකුගේ සහභාගිත්වය සහිතව නිවැරදි ප්‍රසම්පාදන පිළිවෙත අනුගමනය කරමින් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුහමු අනුමතකල ප්‍රමාණ බිල්පත් අනුව සකස් කරනලද ඇස්තමේන්තුව. |